# ***One Stop Super* අලෙවි පරිශ්‍රය සඳහා ව්‍යවසායකයන් තෝරාගැනීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බටඅත පිහිටි **One Stop Super** අලෙවි මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා පහත ව්‍යවසායක අවස්ථා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **එළවලු, පළතුරු ආදී බෝග නිෂ්පාදන අලෙවි කිරීමේ ව්‍යවසායක**
2. **අගය එකතු කළ කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේ ව්‍යවසායක**

ඉහත ව්‍යවසායක අවස්ථා සඳහා කැමැත්තක් දක්වන පුද්ගලයන්, ගොවි සමිති, සංවිධාන සහ සමාගම් වලට මේ සඳහා අයදුම් කළ හැකි අතර ඒ අතරින් දෙදෙනෙකු ඉහත අවස්ථා දෙක සඳහා **One Stop Super පරිපාලන කමිටුව මඟින් සම්මුඛ පරීක්ෂණයකින්** අනතුරුව තෝරා ගනු ලැබේ.

***අයදුම් කිරීමට ඇති සුදුසුකම්***

- **හම්බන්තොට දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවකු හෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලියාපදිංචි ආයතනයක් හෝ සංවිධානයක් හෝ වීම.**
- **තෝරාගන්නා ක්ෂේත්‍රයේ අගය දාමයට සම්බන්ධ අයෙකු වීම.**
- **ආයෝජන හැකියාවක් තිබීම.**
- **අපරාධ හෝ සිවිල් නීතිරීති පදනම්ව උසාවියකින් වරදකරු බවට පත් වී හෝ නඩු පවරා නොමැති බවට ලිඛිත තහවුරුවක් තිබීම.(ග්‍රාම නිළධාරී මඟින් හෝ පොලිස් සහතිකයක් මඟින් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ හැකිය.)**
- **කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන තැනැත්තෙකු හෝ එම තැනැත්තෙකුගේ ළඟ ඥාතියෙකු (මව ,පියා, දරුවන්, සහෝදර, සහෝදරියන්, භාර්යාව, ස්වාමි පුරුෂයා) නොවීම.**

මේ සඳහා වූ අයදුම්පත් දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයෙන් හම්බන්තොට පිහිටි කෘෂිකර්ම අමාත්‍යංශය සතු ආයතන වලින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් **2020.06.03** දින සිට ලබා ගත හැකි අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2020.06.10** දින මධ්‍යහන **12.00** ට පෙර හම්බන්තොට දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදීමට කටයුතු කළ යුතුය.අයදුම්පත www.hambantota.dist.gov.lk වෙබ් අඩවියෙන් භාගත කර ගැනීම ද කළ හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් agridohambantota@gmail.com යන විද්‍යුත් ලිපිනයට ඉහත සඳහන් දින හා වේලාවට පෙර යොමු කිරීමද කළ හැකිය.

සභාපති

පරිපාලන කමිටුව

One Stop Super.

## ***One Stop Super*** *අලෙවි පරිශ්‍රය සඳහා ව්‍යවසායකයන් තෝරාගැනීමේ අයදුම් පත්‍රය*

**අයදුම්පත් අංකය**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) : ..........................................................................................

02. මුලකුරු වලින් හැඳින්වෙන නම් : ..........................................................................................

03.ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................................................

04.ලිපිනය : ..........................................................................................

05.ග්‍රාම නිලධාරී වසම : ..........................................................................................

**06.**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................................................

07.අයදුම්කරුගේ වයස : ..........................................................................................

08.වර්තමාන රැකියාව : ..........................................................................................

09.රැකියා ස්ථානයේ ලිපිනය : ..........................................................................................

**10**.බෝග වගා සිදුකරයි නම් ඒ පිළිබඳ විස්තර : ..........................................................................................

| බෝගය | වගා වපසරිය(අක්) | ඉඩමේ අයිතියේ ස්වභාවය සින්නක්කර/බලපත්‍ර/බදු | අපේක්ෂිත හෝ ලැබූ අස්වැන්න(කි.ගෑ) | අලෙවි ක්‍රමවේදය |
|---|---|---|---|---|
| | | | | |

11.අගය එකතු කළ නිෂ්පාදන සිදුකරයි නම් ඒ පිළිබඳ විස්තර :

| නිෂ්පාදනය | මාසික නිෂ්පාදන ප්‍රමාණය | අළෙවි මිළ | අලෙවි ක්‍රමවේදය |
|---|---|---|---|
| | | | |

**12.**ආහාර බෝග නිෂ්පාදනයේ දී සහ අගය එකතු කළ නිෂ්පාදන සිදුකිරීමේ දී අගය දාමයට සම්බන්ධ ස්ථාන කෙටියෙන් පැහැදිලි කරන්න.

13.පවුලේ ආදායම් මාර්ග සහ ප්‍රමාණ : ....................................................................................

| ආදායම් ලැබීමේ ක්‍රමවේදය | මාසික ආදායම |
|---|---|
| | |

ඉහත සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවත් යම් හෙයකින් එහි අසත්‍යතාවයක් හෙලිවුවහොත් මෙම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමකට හෝ ඉහත ව්‍යවසායක අවස්ථාවෙන් මා ඉවත් කිරීමකට එකඟ බවත් ප්‍රකාශ කරමි. තවද මාගේ ජීවත කාලය තුළ අපරාධ හෝ සිවිල් නීතිරීති පදනම් ව උසාවියකින් වරදකරු බවට පත් වී හෝ නඩු පැවරීමකට යටත් වී නොමැති බවත් මාගේ ළඟ ඥාතියෙකු කෘෂිකර්ම අමාත්‍යංශයේ හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවය නොකරන බවත් ප්‍රකාශ කරමි.

.....................................

දිනය ..................................... අයදුම්කරුගේ අත්සන